**ශීර්ෂය 244 - වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව, වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11 (2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වු ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

  මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් කිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ප්‍රාග්ධන වැය විෂයයන් 3 ක ඉතිරිය සියයට 9 සිට 12 ක් වූ අතර එක් වැය විෂයයක ඉතිරිය සියයට සියයක් විය. | ඇස්තමේන්තු තාත්වික ලෙස පිළියෙල කිරීමට කටයුතු කළ යුතු වීම. | දක්වා ඇති නිරීක්ෂණ හා එකඟවෙමි. |
| (ආ) | පුනරාවර්තන වැය විෂයයන් 05 ක ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 21 සිට සියයට 73ක් දක්වා පරාසයක විය. | -එම- | අයවැය යෝජනා සකස් කිරීමට අදාළ රාජකාරී කටයුතු සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබුනත් එම කටයුතු අපේක්ෂිත පරිදි සිදු නොවීම. පසුගිය වර්ෂ හා සාපේක්ෂව, අපේක්ෂිත ලෙස නිලධාරීන් සඳහා විදේශීය පුහුණු අවස්ථා නොලැබීම. |

### 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වැය විෂයයන් 04 කට අදාල බැරකම් වල එකතුව විසර්ජන ගිණුමට අනුව, බැරකම් පිළිබඳ ප්‍රකාශයට අනුව සහ වවුචර් වලට අනුව පිළිවෙලින් රු.379,431 ක, රු. 87,850 ක හා රු.481,951 ක වෙනසක් විය. | නිවැරදිව හඳුනාගෙන ගිණුම්වල දැක්වීමට කටයුතු කළ යුතුය. | බැරකම් ලේඛනය යාවත්කාලීන කර ගන්නා ලදි. |

### 2.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| නිරීක්ෂණය | නිර්දේශය | දෙපාර්තමේන්තුවේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුවෙහි මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරි හා ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිකත්වය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති පාලනය ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු බවත්, එම සාමාලෝචනයන් ලිඛිතව සිදුකර පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයක් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අග්‍රිම කළමනාකරණය, වියදම් කළමනාකරණය, බැරකම් හා බැඳීම්වලට එළඹීමේ දුර්වලතා හා නීති රීති රෙගුලාසිවලට අනුකූල නොවීමට අදාළ පිළිතුරු 2.1, 2.2, 2.3 හා 2.5 යටතේ පිළිවෙලින් ඉදිරිපත් කර ඇත. ඒ අනුව විගණන නිරීක්ෂණ සමඟ එකඟ නොවෙමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1. සැලැසුම් කිරීම

2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ඉදිරිපත් කළ ක්‍රියාකාරි සැලැස්ම පහත සඳහන් කරුණු ඇතුලත්ව නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට යාවත්කාලීන කරන ලද ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සේවයේ සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර හා වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම | ක්‍රියාකාරි සැලැස්ම අදාල චක්‍රලේඛය ප්‍රකාරව සකස් කල යුතුය. | නිරීක්ෂණ හා එකඟවෙමි. 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සමඟ ඇතුලත් කළයුතු බවට පෙන්වා ඇති තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

## 3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් අනුව රේගු ආඥා පනතේ 19 (අ) වගන්ති වල සඳහන් විධිවිධානයන්ට හා රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව තීරු බදු කපාහැරීම්, අත්හැරීම් හා තීරුබදු සහන ලබාදීම්වලට අදාල කටයුතු වෙළඳ හා ආයෝජන දෙපාර්තමේන්තුව විසින් සිදු කරන බවට අනාවරණය වූ නමුත් එසේ තීරු බදු සහන ලබාදීම් විස්තර ගැසට් පත්‍රයේ පලකර පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට අදාල කටයුතු 2016 දෙසැම්බර් 31 දින සිට විගණිත දිනය වූ 2019 මැයි 10 දින වන විටත් සිදු කර නොතිබුණි. | අදාළ විධිවිධානයන්ට හා රාජ්‍ය ප්‍රතිපත්ති වලට අනුකූලව තීරු බදු කපාහැරීම්, අත්හැරීම් හා තීරුබදු සහන ලබා දීමට අදාලව ගැසට් පත්‍රෙය් පලකිරීම් සිදු කිරීමට කටයුතු කළ යුතුය. | රේගු ආඥා පනතේ 19 (අ) වගන්තිය යටතේ 2017 වර්ෂයේදී සිදු කරන ලද තීරු බදු කපා හැරීම් සම්බන්ධයෙන් රේගු දෙපාර්තමේන්තුව එවා ඇති තොරතුරුවල ඇති අඩු පාඩු නිවැරදි කර නැවත ඉදිරිපත් කරන ලෙස රේගු දෙපාර්තමේන්තුවට උපදෙස් ලබා දී ඇති අතර එම නිවැරදි කිරීම් සම්පූර්ණ කල වහා අදාළ ගැසට් පත්‍රය නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

පහත සඳහන් නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2015-2030 කාලය තුළ ලබා කර ගත යුතු තිරසර සංවර්ධන අරමුණු 17 ක් පිළිබඳව දෙපාර්තමේන්තුවේ අවධානය යොමු විය යුතු වුවද ඒ අනුව 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම ඇතුළු සැලසුම් සකස් වී නොතිබුණි. | ළඟා කර ගත හැකි තිරසර සංවර්ධන අරමුණු කෙරෙහි අවධානය යොමු කරමින් එම අරමුණු කඩිනමින් ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. | 2017 වර්ෂයේ කළමනාකරණ හා විගණන වාර්තාව සම්බන්ධ නිරීක්ෂණ ඉදිරිපත් කිරීමේදී සඳහන් කල පරිදි තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීම සඳහා මෙම දෙපාර්තමේන්තුව සෘජුවම සම්බන්ධ නොවන බවත් වෙනත් ආයතනවලට එම අරමුණු ඉටුකරගැනීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම මඟින් තිරසර සංවර්ධන අරමුණු ඉටුකරගැනීමට වක්‍රාකාරව දායකවන බවත් සඳහන් කරමි. එබැවින් 2018 වර්ෂයේ මෙම දෙපාර්මේන්තුවේ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් ක්‍රියාකාරකම් විවිධ රාජ්‍ය ආයතනවල තිරසර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම සඳහා ඉවහල් වේ. |

**5. මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණය විය.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ තනතුරු 12 ක් පුරප්පාඩුව පවතින අතර එය අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 19 කි. මෙම පුරප්පාඩු තුල ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 04 ක් විය. | දෙපාර්තමේන්තුවේ සේවක පුරප්පාඩු වලට විධිමත් පරිදි බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. | 2018.12.31 දිනට පැවති පුරප්පාඩුවලින් දැනට පුරප්පාඩුව පවතින්නේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 03 ක් ඇතුළුව පුරප්පාඩු 07 ක් පමණි.<br>තීරුබදු විශ්ලේෂක තනතුරු 02 සඳහා බඳවාගැනීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගෙන ඇත. |